

# දුරකථනය ඔස්සේ භාෂණ පරිවර්තකයින් යොදාගන්නා විටදී බලාපොරොත්තු විය හැකි දේ

## භාෂණ පරිවර්තකයකු යනු කවරෙක්ද?

භාෂණ පරිවර්තකයකු යනු ඔබේ භාෂාව කතා කරන්නෙකි. ඔවුන්ගේ කාර්යය වනුයේ ඔබට ඉංග්‍රීසියෙන් කතා කිරීමට අපහසුවක් දැනේ නම් ඔබට අවශ්‍ය යමක් පැවසීමත් ඔබ වෙත පැවසූ යමක් වටහා දීමට සහය වීමත්ය.

## භාෂණ පරිවර්තකයකු කරන්නේ කුමක්ද?

ඔවුන්ගේ කාර්යය වනුයේ ඔබ පැවසූ දෙය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමය, මේමගින් කෙරෙන්නේ ඔබ හා කතා කරන කාර්ය සාධකයා හට ඔබව වටහා ගැනීමටත් කාර්ය සාධකයා ඉංග්‍රීසියෙන් පැවසූ දෑ ඔබට වටහා දීමත්ය. කාර්ය සාධකයා යනු ඔබේ සිද්ධි කළමනාකරු, වෛද්‍යවරයා, උපදේශකයා, ප්‍රජා සේවකයා හෝ එවැනි තවත් අයෙකු විය හැකිය.

අදහස් දැක්වීමට, උපදෙස් දීමට හෝ පුද්ගලික අදහස ඉදිරිපත් **නොකිරීමට** භාෂණ පරිවර්තකයන් පුහුණු වී ඇත. **ඔව්හු, ඔබ විසින් පවසනු ලැබූ සියල්ල හැර අන් කිසිවක් පරිවර්තනය නොකළ යුතුය**.

## භාෂණ පරිවර්තකයකු දුරකතනයෙන් සහය වන්නේ කෙසේද?

විවිධ තැන්වල සිටියද, ඔබ, භාෂණ පරිවර්තකයා සහ කාර්ය සාධකයා යන සියලු දෙනා දුරකතන ඇමතුම මගින් එකවර සම්බන්ධ වෙනු ඇත. ඔබ කතා කරන විට භාෂණ පරිවර්තකයාට නොව කාර්ය සාධකයාට සෘජුවම අමතන්නාක් මෙන් කතා කරන්න. ඔබ කතා කොට අවසන් වූ විට ඔබ කියූ දේ භාෂණ පරිවර්තකයා විසින් කාර්ය සාධකයා වෙත පරිවර්තනය කරනු ලබනු ඇත.

**දුර ඇමතුම අතරතුර ඔබ කළ යුතු දෑ**

> කෙටි වාක්‍ය භාවිතා කොට භාෂණ පරිවර්තකයා එය පරිවර්තනය කරන තුරු සිටින්න.

> නැවත කතා කිරීමට පෙර භාෂණ පරිවර්තකයා සිය පරිවර්තන කාර්යය අවසන් කරන තුරු ඉවසිලිවන්තව සිටින්න.

> ඔබට යමක් නොවැටහේ නම් භාෂණ පරිවර්තකයා හට එය පවසන්න. ඔබට පැහැදිලි කර ගැනීමක් හෝ වැඩිදුර තොරතුරු ඉල්ලා සිටීමක් සඳහා ඕනෑම විටෙක සන්වාදය නැවත්විය හැක.



## මා භාෂණ පරිවර්තකයා හඳුනන්නේ නම් කුමක් කළ යුතුද?

භාෂණ පරිවර්තකයා ඔබ දන්නා අයෙකු බව වැටහේ නම් එකී භාෂණ පරිවර්තකයා තවදුරටත් යොදා ගැනීම ඔබේ තීරණය වේ. ඔබ එසේ නොකිරීමට තීරණය කරයි නම් කාර්ය සාධකයා වෙත දැනුම් දිය හැක. ඔබට යම් අපහසුතාවයක් දැනෙනවානම් ඒ බව පවසා ඔබට ඇමතුම අවසන් කළ හැකිය. වෙනත් භාෂණ පරිවර්තකයකු සමග වෙනස් කාල වේලාවක් වෙන් කරවා ගත හැකිය.

## භාෂණ පරිවර්තනය පිළිබඳ මා සෑහීමකට පත් නොවේ නම්?

භාෂණ පරිවර්තනය පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවේ නම්, ඒ බව පවසන්න. ඔබට භාෂණ පරිවර්තකයා තේරුම් ගැනීමට අපහසු නම් ඒ බව දුරකතන ඇමතුමේදීම කාර්ය සාධකයා වෙත දැනුම් දෙන්න. වෙනත් භාෂණ පරිවර්තකයකු සමග වෙනස් කාල වේලාවක් වෙන් කරවා ගත හැකිය.

## මා හට පිරිමි හෝ ගැහැණු භාෂණ පරිවර්තකයකු ඉල්ලා සිටිය හැකිද?

ඔව්. භාෂණ පරිවර්තකයකු අවශ්‍ය දැයි අසා සිටින පළමු අවස්ථාවේදීම පිරිමි හෝ ගැහැණු භාෂණ පරිවර්තකයකු සඳහා මනාපයක් ඇති නම් ඒ බව කිව යුතුය. මේ නිසා භාෂණ පරිවර්තකයකු වෙන් කරවා ගැනීමට අමතර කාලයක් ගත වන්නට ඉඩ ඇත.

## මගේ ගැටළු භාෂණ පරිවර්තකයා හා පැවසීම ආරක්ෂා සහගතද?

අවංක හා විවෘත අයුරින් ඔබේ තොරතුරු නිරාවරණය කිරීම වැදගත් වේ. බිය හෝ චකිතය හේතු කොට ගෙන ඔබේ ගැටළු පිළිබඳව කතා කිරීම හෝ තොරතුරු නිරාවරණය කිරීම නොනවත්වන්න. භාෂණ පරිවර්තකයින් ඇත්තේ ඔබත් ඔබේ කාර්ය සාධකයාත් එකිනෙකා වටහා ගැනීම සිදුවන බවට වගබලා ගැනීමටය. භාෂණ පරිවර්තකයා හට කල හා කල නොහැකි දේ පිළිබඳව රෙගුලාසි ඇත. (මේවා AUSIT ආචාර ධර්ම පද්ධතිය නම් වේ). මෙහි අරුත නම්, භාෂණ පරිවර්තකයා හට ඔබේ ගැටළු පිළිබඳව වෙනත් අයකු හා කථා කල නොහැකි බවයි.

භාෂණ පරිවර්තකයා හට ඔබ නොපෙනීම නිසා ඔබ පවසන දෑ දුරකතනය ඔස්සේ භාෂණ පරිවර්තකයකු භාවිතා කිරීම මගින් පුද්ගලිකත්වය සුරක්ෂිත වීමට ආධාර වේ. මෙය ප්‍රමාණවත් නොවේ නම්, වෙනත් ප්‍රාන්තයක සිටින භාෂණ පරිවර්තකයකු වෙන් කර දෙන මෙන් ඔබට ඉල්ලා සිටිය හැක. (උදාහරණයක් ලෙස ඔබ වික්ටෝරියා හි ජීවත් වේ නම් භාෂණ පරිවර්තකයා ක්වීන්ස්ලන්තයේ ජීවත් විය හැකිය). ඔබේ සත්‍ය නාමය භාෂණ පරිවර්තකයා ඉදිරියේ භාවිතා නොකරන ලෙස ඔබේ කාර්ය සාධකයා ගෙන් ඉල්ලා සිටීමටද හැකිය. මෙකී විකල්පයන් සැම විටම ඉටු කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න.

**මතක තබා ගත යුතු දෑ**

> භාෂණ පරිවර්තකයින් හට ඇත්තේ ඔබේ කාර්ය සාධකයා සමග නිදහස්ව හා විවෘතව ඔබට කතා කිරීමට සහය වීමටය.

> භාෂණ පරිවර්තකයින් ඔබ පවසනු ලැබූ දෑ පමණක් පරිවර්තනය කරති : කිසිවක් අඩු හෝ වැඩි නොවේ.

> භාෂණ පරිවර්තකයා හට දුරකතන ඇමතුම ඔස්සේ ඔබ පවසනු ලබන දෑ කිසිවෙකු හා කිව නොහැක.

> ඔබට වඩා පහසු බවක් හැඟේ නම්, පිරිමි හෝ ගැහැණු භාෂණ පරිවර්තකයකු ඉල්ලා සිටිය හැකිය.

> භාෂණ පරිවර්තකයා සමග යම් අපහසුතාවයක් දැනේ නම් හෝ සෑහීමකට පත් නොවේ නම් වෙනත් අයෙකු ඉල්ලා සිටිය හැක.

inTouch
Multicultural Centre Against Family Violence

ඉහත තොරතුරු ගොනු කරනු ලැබුවේ inTouch | intouch.org.au | 2020 මගිනි ඔබ පවුල් හිංසනය අත්විඳී නම් 1800 755 988 අමතන්න.

ගෘහස්ථ හිංසනයට එරෙහි inTouch බහු සංස්කෘතික මධ්‍යස්ථානය වික්ටෝරියානු රජයේ සාධාරණ අනුග්‍රහය යටතේ පවත්වාගෙන යනු ලැබේ. ග

VICTORIA State Government